# අතීතාද්‍යතන පාලි ව්‍යාකරණ සම්ප්‍රදායයන්

ගෞරව ශාස්ත්‍රවේදී පූජ්‍ය පහලගම ධම්මික හිමි

ත්‍රිපිටකය අධ්‍යයනය (Study) කිරීමේ දී භාෂාව විග්‍රහ කිරීම තේමාකරගත් ව්‍යාකරණ ක්‍රමයක් දක්නට නොලැබුනත් බුද්ධ සුභාෂිතය තුළ නූතන ව්‍යාකරණයේ අනන්‍ය මර්යාදා කථෝපකථනය කළ හැකිය. එයින් ව්‍යාකරණ ඉගැන්වීමේ ආධ්‍යාශයක් ත්‍රිපිටකයේ එය අනාවරණය නොවේ. එමෙන් ම තදීය අට්ඨකථා හා ටීකාවල දී ද එකී ව්‍යාකරණ ලක්ෂණ දක්නට ලැබේ. මහාගෝසිංග සූත්‍රයේ දී ආනන්ද තෙරුන් ධර්මදේශනයේ දී පැවතිය යුතු ලක්ෂණ කීපයක් ප්‍රකාශ කරයි. *"සෝ චතස්සාන්නං පරිසානං ධම්මං දේසේති පරිමණ්ඩලේහි පදබ්‍යඤ්ජනේහි අප්පාබාධෙහි අනුසයසමුග්ඝාතාය"*[1] මෙම දසපදබ්‍යඤ්ජනය පිළිබඳ අර්ථවර්ණනා කරන අටුවාචාරීන් ලක්ෂණ දහයක් පෙන්වා දෙයි.

*"සිථිලධනිතඤ්ච දීඝරස්සං,*
*ලහුකගරුකඤ්ච නිග්ගහීතං*
*සම්බන්ධං වවත්ථිතං විමුත්තං*
*දසධා බ්‍යඤ්ජනබුද්ධිප්පභේදා"*[2]

ධර්ම දේශනයේ දී සිදුකරන වචන උච්චාරණය සඳහා සිථිල (අල්ප ප්‍රාණාක්ෂර) ධනිත (මහප්‍රාණාක්ෂර) දීඝ (දීඝාක්ෂර) රස්ස

(හ්‍රස්වාක්ෂර) ලහුක (කේවල හ්‍රස්වාක්ෂර) ගරුක (දීර්ඝ, ප්ලුත, බන්ධනාක්ෂර, හල් අක්ෂර හා නිග්ගහීතයට පෙර හ්‍රස්වාක්ෂරය) නිග්ගහීතය (බින්දුව) සම්බන්ධ (පූර්වාපරාක්ෂර සම්බන්ධය) වවත්ථිත (පද බෙදීම) විමුත්ත (හඬ නිකුත් කිරීම)[3] පැවතිය යුතු ලක්ෂණ මෙයින් ගම්‍ය වෙයි. දසාකාර වූ බ්‍යඤ්ජනබුද්ධිය[4] උච්චාරණයේ දී ඉතා උසස් සේ පෙනේ. එසේ ම නාම පදයේ අංශ හතරකි. *"චතුබ්බිධං වා නාමං ආවත්ථිකං ලිංගිකං නේමිත්තකං අධිච්චසමුප්පන්නන්ති"*[5] විමතිවිනෝදනී ටීකාවේ දී *"අවත්ථාය විදිතං ආත්ථිකං, එවං ලිංගිකං, නිමිත්තතෝ ආගතං නේමිත්තං, අධිච්චං යං කිඤ්චි අධිවචනං අනපෙක්ඛිත්වා පවත්තං අධිච්චසමුප්පන්නං"* වශයෙන් විවරණය කරයි. ථෙරවාදී සාහිත්‍යයේ මූලික ව්‍යාකරණමය වූ ලක්ෂණ සොයාගැනීමට පුළුවන. එයින් ස්ඵුට වන්නේ ථෙරවාදී ග්‍රන්ථ මූලික කොටගෙන අට්ඨකථා යුගයට පෙර ලක්දිව කිසියම් ව්‍යාකරණ ක්‍රමයක් තිබූ බව පෙනේ. අට්ඨකථා යුගයේ දී දැනට නාමශේෂව පවත්නා ව්‍යාකරණ ක්‍රමයක් අටුවාචාරීන් භාවිත කොට ඇති බව අට්ඨකථා අධ්‍යයනයෙන් පැහැදිලිවෙයි. එකී ව්‍යාකරණ සඳහා පෙළ තුළ දක්නට ලැබෙන ව්‍යාකරණ ඡයා ගුරුකොට ගත්බව උපකල්පනය කළහැකි ය.

අට්ඨකථා රචනයේ දී දැනට ලක්දිව සුභාවිත ව්‍යාකරණ රචනා වී නොමැති හෙයින් වෙනත් ව්‍යාකරණ භාවිත කොට ඇත. ඒ සුපැහැදිලි සාක්ෂ්‍ය වන්නේ අට්ඨකථාවන්හි දී විභක්ති හඳුන්වා ඇති ආකාරය යි. සාමාන්‍ය විභක්ති සංඛ්‍යාත්මක ක්‍රමයට නම් කොට ඇත. නමුත් පැරණි ව්‍යාකරණයේ දී විභක්ති හඳුන්වන්නේ මෙසේ ය, ප්‍රථමා (පච්චත්ත) ද්විතීයා (උපයෝග) තෘතියා (කරණ) චතුර්ත්ථී (සම්පදාන) පංචමී (නිස්සක්ක) ෂෂ්ඨී (සාමි) සප්තමී (භුම්ම) ආලපන (ආලපන විභක්ති සඳහා පැරණි ව්‍යාකරණයේ දී නමක් හමු නොවෙයි) නමුත් ආලපන හා සම්බන්ධ යන නාමයන් භාවිත කරනු ලබයි. මෙම විභක්ති නාම නම්,

*"තං තං අත්ථමවෙක්ඛිත්වා,*
*භුම්මේන කරණෙන ච*
*අඤ්ඤත්‍ර සමයෝ වුත්තෝ*
*උපයෝගෙන සෝ ඉධාති"*[6]

සංස්කෘත ක්‍රමයට විභක්ති නම් කළත් ඉපැරණි ව්‍යාකරණයේ දී ස්වාධීන නම් යොදා තිබෙන බව පෙනෙයි. මුල් බුදුසමයේ දී හා පශ්චාත්තන යුගයන්හි දී පාලි භාෂාව සඳහා ව්‍යාකරණ ඉගැන්වීමේ නිශ්චිතක්‍රමෝපයයන් විද්‍යමාන නොවේ. පස්වැනි සියවසේ බුද්ධඝෝස අට්ඨකථාචාරීන් මහාවිහාරයට සම්ප්‍රාප්තවීමේ දී ලක්දිව භාවිත වූ ව්‍යාකරණ ග්‍රන්ථ ගණනාවක් පිළිබඳ තොරතුරු අනාවරණය වෙයි.

01. නිරුත්ති පකරණය
02. මහානිරුත්ති ව්‍යාකරණය
03. චූලනිරුත්ති ව්‍යාකරණය
04. සබ්බගුණාකර ව්‍යාකරණය
05. බෝධිසත්ත ව්‍යාකරණය[7]

දැනට නාමශේෂ ව්‍යාකරණය ග්‍රන්ථ කීපයක් පිළිබඳ තොරතුරු හමුවෙයි. මෙම ව්‍යාකරණය සද්දලක්ඛණ නමින් හඳුන්වා ඇති බව පෙනේ.[8] "*වණ්ණාගමෝ වණ්ණවිපරියායෝති ආදිකං නිරුත්ති ලක්ඛණං ගහෙත්වා සද්දනයේන වා*" යනුවෙන් ව්‍යාකරණ විධීන් දක්වන ස්ථානයේ දී "සද්දනය" යනුවෙන් හඳුන්වන්නේ සමකාලීනව පැවැති ව්‍යාකරණ ශාස්ත්‍රයන් විය හැකි ය. ඉපැරණි ම ව්‍යාකරණය වශයෙන් සැළකෙන්නේ නිරුත්ති ප්‍රකරණය යි. මෙහි කර්තෘත්වය මහාකච්චායන හිමියන්ට පවරනු ලබයි.[9] චූලනිරුත්ති හා නිරුත්ති පිටකය ග්‍රන්ථ දෙකක් වශයෙන් පෙනේ.[10] චූලනිරුත්ති ව්‍යාකරණය යමක නම් තෙරනමක් විසින් රචිත බව පයෝගසිද්ධි (1974 සංස්කරණ) සංඥාපනයේ දී කෝදාගොඩ ඤාණාලෝක හිමියෝ ප්‍රකාශ කරති. සබ්බගුණාකර ව්‍යාකරණය හා බෝධිසත්ත ව්‍යාකරණය මුල්කාලයේ ව්‍යාකරණ ග්‍රන්ථ වශයෙන් අට්ඨකථාචාරීන් සිය අට්ඨකථාකරණයේ දී භාවිත කළ බව සිතිය හැකි ය. සබ්බගුණාකර ව්‍යාකරණයේ දී මොග්ගල්ලායනය මෙන් ම අක්ෂර 43 නිර්දේශ කරයි. "සිද්ධක්කමාදයො වණ්ණක්ඛරාතිතාළිසා"[11] බෝධිසත්ත ව්‍යාකරණයේ දී කච්චායන හා මොග්ගල්ලායන යන ව්‍යාකරණ සම්ප්‍රදායයන් දෙක ම අනුව නොයමින් අනන්‍ය වූ ක්‍රමයක් භාවිත කොට ඇති බව පෙනීයයි.

අක්ෂර 40 නිර්දේශ කරනු ලබයි. "නරවරවචනොපකාරානි චත්තාළීසක්ඛරා"[12] ඉපැරණි නාමශේෂ පාලි ව්‍යාකරණ මූලාශ්‍රය කොටගෙන විද්‍යමාන පාලි ව්‍යාකරණ ග්‍රන්ථ සකස්වන්නට ඇති බව පෙනේ.

ටීකා ග්‍රන්ථ තුළ සංස්කෘත භාෂාවිෂයික සංඛ්‍යාත්මක ක්‍රමයට විභක්ති හඳුන්වා තිබීමෙන් පෙනී යන්නේ එකල විද්‍යමාන ව්‍යාකරණ සකස්වන්නට ඇති බවයි. අට්ඨකථා රචිත යුගයට පූර්වයෙන් පාලි ව්‍යාකරණ ග්‍රන්ථ පැවති බවත් ඒවා මූලික වශයෙන් පෙළේ ඡයාමාත්‍ර වශයෙන් හමුවන ව්‍යාකරණ ලක්ෂණ උපයුක්ත කරමින් සකස්කළ බවත් එකී නාමශේෂ පාලි ව්‍යාකරණ මුල්කරගනිමින් විද්‍යමාන පාලි ව්‍යාකරණ සකස්වන්නට ඇති බවත් පෙනී යයි.

## කච්චායන ව්‍යාකරණය

ලංකාවේ විද්‍යමාන පාලි ව්‍යාකරණ සම්ප්‍රදායන් අතර ඉතාම ජනප්‍රිය මෙන් ම ඉපැරණි ව්‍යාකරණ සම්ප්‍රදාය වන්නේ කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදාය යි. මෙකී ව්‍යාකරණ සම්ප්‍රදාය සතුව ව්‍යාකරණ ග්‍රන්ථාවලියක් දක්නට තිබේ. සරළ ව්‍යාකරණයේ සිට ගැඹුරු ව්‍යාකරණය දක්වා ම එකී ග්‍රන්ථ සම්පාදනය කොට තිබේ. එයින් කච්චායන ව්‍යාකරණය බොහෝ සෙයින් ලක්දිව භාවිත වෙයි. මෙහි කර්තෘ පිළිබඳ ඒකමතික නිගමනයක් උගතුන් අතර නැත. කච්චායන ව්‍යාකරණයේ කර්තෘ අවන්ති ජනපදයේ වාසය කළ මහාකච්චායන තෙරුන් බව සඳහන් වන අතර මහාකච්චායන තෙරුන්ගේ පූර්ව ප්‍රාර්ථනයක් හේතුවෙන් මහානිරුත්තිප්‍රකරණය, නෙත්තිප්‍රකරණය හා කච්චායන ව්‍යාකරණය කළ බව දක්වේ. *''අත්තනො පුබ්බපත්ථනාවසේන කච්චායනප්පකරණං මහානිරුත්තිප්පකරණං නෙත්තිප්පකරණන්ති පකරත්තයං සංඝමජ්ඣෙ බ්‍යාකාසි''*[13] මහාරූපසිද්ධි ටීකාවේ දී බුදුරදුන් සංක්ෂිප්ත වශයෙන් දේශනා කළ සූත්‍රය මහාකච්චායන තෙරුන් විසින් විස්තර වශයෙන් අර්ථ විභජනය කරමින් කච්චායන ව්‍යාකරණය රචනා කළ බව දක්නට ලැබේ.[14] මහාකච්චායන තෙරුන්ට කච්චායන ව්‍යාකරණයේ කර්තෘත්වය කච්චායන

සුත්තනිද්දේසයේ දී[15] ද පවරනු ලබයි. බුදුරදුන්ගේ ශ්‍රී මුඛ දේශනාවක් ලෙස අත්ථෝ අක්ඛරසඤ්ඤාතෝ යන සූත්‍ර පාඨය මුල් කරගෙන මහාකච්චායන තෙරුන් විසින් කච්චායන ව්‍යාකරණය රචනා කළ බව මෙයින් සුසූචිත ය. එසේ ම තත්කර්තෘත්වය කච්චාන වණ්ණනාවේ දී ද එම තෙරුන්ට ම පවරා ඇත.[16] මහාකච්චයන තෙරුන්ට භාරකරනු ලබයි. මෙකී ව්‍යාකරණයේ කර්තෘත්වය මහාකච්චායන හිමියන්ට පැවරීම පාරම්පරික ප්‍රපංචයක් සේ පෙනේ, ඊට අමතරව පිළිගත හැකි සුසාධකයන් දක්නට නැත. කෙසේ වෙතත් කච්චායන ව්‍යාකරණය ඒකකර්තෘක කෘතියක් නොවෙයි.

*"කච්චානේන කතෝ යෝගා වුත්ති ච සංඝනන්දිනා,*
*පයෝගෝ බ්‍රහ්මදත්තේන න්‍යාසෝ විමලබුද්ධිනා"*[17]

මෙයින් සඳෘශ්‍ය වන්නේ කච්චායන ව්‍යාකරණයේ සූත්‍ර පමණක් කච්චායන නාමයේ හඳුවනු ලබන කිසියම් තෙර කෙනෙකු විසින් රචනා කළ බවයි. ඊට අදාළ වෘත්ති සම්පාදනය සංඝනන්දි නම් වූ තෙර කෙනෙකු විසින් හා උදාහරණ බ්‍රහ්මදත්ත නම් තෙර කෙනෙකු විසින් රචනා කළ බවයි. සූත්‍ර, වෘත්ති හා උදාහරණ යන අංග තුනේ ම ඒකමිතිය කච්චායන ව්‍යාකරණය නමින් හඳුන්වනු ලබයි. කච්චායන ව්‍යාකරණය බුද්ධකාලීන මහාකච්චායන තෙරුන් විසින් රචනා වූවා නම් ක්‍රි:පූ පස්වන සියවසේ දී පමණ රචනා කළ අට්ඨකථා සඳහා බුද්ධඝෝස හිමියන් මෙම කච්චායන ව්‍යාකරණය යොදා ගැනිම කළ යුතුය නමුත් ප්‍රාග් අට්ඨකථා යුගයේ දී තිබූ ව්‍යාකරණ භාවිත කොට තිබේ. මෙසේ බලන විට කච්චායන ව්‍යාකරණය පශ්චාත්කාලීන කෘතියක් බව පෙනීයයි. ඊට හේතුව ටීකා සම්පාදනයේ දී කච්චායන ව්‍යාකරණය භාවිත කිරීමයි. ඒ අනුව කච්චායන ව්‍යාකරණය 10 හෝ 11 වැනි සියවස්වල දී රචනා වූ බව බොහෝ විද්වත්හු කල්පනා කරති.[18] කච්චායන ව්‍යාකරණය රචිත කාලය පිළිබඳ එළඹිය හැකි නිගමනය වන්නේ අට්ඨකථා හා ටීකා රචිත කාල පරාසය අතර රචනා කරන්නට ඇති බවයි.

කච්චායන ව්‍යාකරණයේ සූත්‍ර 675 අන්තර්ගත වන අතර එකී සෑම සූත්‍රයක් ම වෘත්ති හා උදාහරණ දක්වමින් විහිත කාර්යය

නිර්දේශ කරයි. සියලු සූත්‍ර මඟින් සිදුවෙන කාර්යය මුල්කොට ගනිමින් වර්ග හයකට වෙන් කර තිබේ.

"සඤ්ඤා ච පරිභාසා ච විධිං නියමමේව ච,
අතිදේසධිකාරෝ ච ඡබ්බිධං සුත්තලක්ඛණං"[19]

යනුවෙන් සංඥා සූත්‍ර, පරිභාෂා සූත්‍ර, විධි සූත්‍ර, නියම සූත්‍ර, අතිදේශ සූත්‍ර හා අධිකාර සූත්‍ර යනුවෙන් වෙන් කොට ගත හැකි ය. පරිච්ඡේද "කප්ප" යන නාමයෙන් නම් කොට තිබේ. කප්ප අටක්පුරා ව්‍යාකරණ විවරණය කරනු ලබයි. කච්චායන ව්‍යාකරණයේ දී කප්ප වශයෙන් බෙදීමේ දී ස්වකීය විභජන ක්‍රමය අපිළිවෙලක් දක්නට තිබේ. කච්චායන ව්‍යාකරණය පාලි ව්‍යාකරණයේ කේන්ද්‍රීය ග්‍රන්ථයකි. කච්චායන ව්‍යාකරණය මුල් කොටගෙන රචිත ටීකා, අනුටීකා හා සන්න රාශියකි. ඒ අතර මුඛමත්ථදීපනී අනුටීකාව, නිරුක්තිසාර මඤ්ජුසා, කසයින් සන්නේ, මුඛමත්ථදීපනී සන්නය, රූපසිද්ධි ව්‍යාකරණය, රූපසිද්ධි ටීකාව, සන්දේහවිඝාතනී පුරාණ සන්නය, රූපසිද්ධි පුරාණ සන්නය, බලාවතාරය, සුබෝධිකා ටීකා, ගඩලාදෙණි සන්නය, බලාවතාර සුගණ්ඨි සන්නය, බාලාවතාර බලන සන්නය, බාලාවතාර ලියන සන්නය, බාලාවතාර සූත්‍ර නිර්දේශය, ගඩලාදෙණි සන්නය, අභිනව චූල නිරුත්තිය හා චූල නිරුත්තිය, සද්දසාරත්ථජාලිනී, සද්දසාරත්ථජාලිනී ටීකා, කච්චායන භේදය, සාරත්ථවිකාසිනී, කච්චායන භේද වණ්ණනා, කච්චායන භේදය, කච්චායන සාර පුරාණ ටීකා, සම්මෝහනාසිනී, බාලප්පබෝධිනී හා ටීකා, සද්දබින්දු, ලීනත්ථ සූදනී, සද්දබින්දු අභිනව ටීකා, සදත්ථ භේද චින්තා හා ටීකා, කාරිකාව, පද භේදය, සුධීරමුඛ මණ්ඩණය හා කාරක පුප්ඵමඤ්ජරී, ණය ලක්ඛණ විභාවිනී, නිරුත්තිසංගහ, සද්දවුත්ති, අභිධාප්පදීපිකා, අභිධානප්පදීපිකා සූචි, කච්චායන ධාතු මඤ්ජුසා, පාළි නාම වරනැඟිල්ල, නාමමාලා, ආඛ්‍යාත වරනැඟිල්ල, කච්චායන විග්ගහ, කච්චාන විග්ගහ ටීකා, රූප මාලාව, සද්දමාලාව හා ආඛ්‍යාත රූප මාලාව. ප්‍රධාන වෙයි. කච්චායන ව්‍යාකරණය මුල් කොට ගෙන විහිදී ගිය ව්‍යාකරණ ග්‍රන්ථාවලිය වශයෙන් සඳහන් කිරීමට පුළුවනි.

## මොග්ගල්ලායන ව්‍යාකරණය

කච්චායන ව්‍යාකරණ සම්ප්‍රදායට පසුව රචනා කළ ව්‍යාකරණ සම්ප්‍රදාය වන්නේ මොග්ගල්ලායන ව්‍යාකරණය යි. එම නිසා මොග්ගල්ලායන ව්‍යාකරණය ලක්දිව රචිත දෙවැනි ව්‍යාකරණය ලෙස පිළිගනී. මෙය මාගධ සද්දලක්ඛණ යන අපර නාමයෙන් ද හඳුන්වනු ලබයි. සුභූති හිමියන් ස්වකීය නාමමාලාවේ දී මොග්ගල්ලායන ව්‍යාකරණය හඳුන්වන පර්යාය නම් දෙකක් දක්වයි. එනම් *(මොග්ගල්ලානවෘත්ති, කච්චායන අමරසිංහ)*[20] රචිත කාලය වන්නේ ක්‍රි:ව: 1153-1186 අතර කාලය යි. එනම් පොළොන්නරු යුගයේ මහාපරාක්‍රමබාහු රාජ සමයයි. ඒ බව,

*"පරක්කම භුජේ තස්මිං සද්ධා බුද්ධි ගුණෝදිතේ,*
*මනනුවංසද්ධජාරේ ලංකාදීපම්පසාසති*
*මොග්ගල්ලානෙන ථෙරේන ධීමතා සුචි වුත්තිනා,*
*රචිතං තං සුවිඤ්ඤෙය්‍යං මසංදිග්ධමනාකුලං*
*අසෙසවිසයව්‍යාපී ජිතව්‍යප්පථ නිස්සයං,*
*සද්දසත්ථමතායයථ සාධියං බුද්ධි වද්ධනං*
*තස්සවුත්ති සමාසෙන විපුලත්ථප්පකාසිනී,*
*රචිතා පුන තෙනෙ ච සසනුජ්ජෝතකාරිනා"*[21]

මෙයින් පළ වන්නේ මොග්ගල්ලායන හිමියන්ගේ බුද්ධි හා මොග්ගල්ලායන ව්‍යාකරණයේ වුත්ති උන්වහන්සේ විසින් රචනා කළ බවයි. වුත්ති පමණක් නොව ඊට අදාළ වණ්ණනාව වූ පඤ්චිකාව ද මොග්ගල්ලායන හිමියන් ම රචනා කොට තිබේ. මොග්ගල්ලායන හිමියන් පිළිබඳව මහාවංසයේ දී හමුවෙයි. උන්වහන්සේ පොළොන්නරු යුගයට සම්බන්ධ බවත් එහි සඳහන් වෙයි.

*"සමොග්ගල්ලානෙනථෙරඤ්ච ථෙර නාගින්දපල්ලියං,*
*යුවරාජස්ස රට්ඨස්මිං අඤ්ඤෙ සබ්බෙ ච භික්ඛවෝ"*[22]

මොග්ගල්ලායන හිමියන් සතු ගුණ කදම්බය වර්ණනාත්මක ස්වභාවයෙන් ඒ පිළිබඳව ප්‍රකාශවන්නේ මෙසේ ය. මෙයින් මොග්ගල්ලායන හිමියන් වාසය කළ යුගය පිළිබඳ යම් නිශ්චයකට ප්‍රාප්ත විය හැකි ය.

*"යා ශක්තිඃ පාණිනෞ යාච චාන්ද්‍රකාකත්‍යායනාදිසු,*
*යෙ යං මූර්තමතී මනෙ‍්‍ය මෞද්ගල්‍යායනරූපිණි"*[23]

ව්‍යාකරණ පිළිබඳ සුවිසල් ඥාණයෙන් වාසය කළ බව මෙයින් දක්වේ. එසේ ම රාහුල හිමියන් පදසාධන ටීකාවේ දී මොග්ගල්ලායනාචාර්යන් පිළිබඳව දක්වයි.[24] මොග්ගල්ලායන හිමියන් මෙහි කර්තෘවරයා බව මෙයින් ගම්‍ය වෙයි. W. Geiger ප්‍රකාශ කරන්නේ අන්‍ය මතයන්ට වඩා වෙනස් මතයක් බව පෙනීයයි. මොග්ගල්ලායන හිමියන් අනුරාධපුර ථූපාරාමයේ වැඩසිටි බව Geiger ගේ අදහසයි.[25] මොග්ගල්ලායන ව්‍යාකරණය වනාහි කච්චායන ව්‍යාකරණයෙන් වියුක්ත රචනා මාර්ගයක් අනුගමනය කොට තිබේ. එසේ සංස්කෘත ව්‍යාකරණයට නැඹුරුවීම ද දක්නට ලැබෙන විශේෂත්වයකි. "අ ආදයෝ තිසාලීසා වණ්ණා"[26] යනුවෙන් අක්ෂර 43 දක්වන අතර කච්චායන ව්‍යාකරණයට වඩා වෙනස්කම්වලින් යුක්තය. එසේ ද නිශ්චිත වශයෙන් ද කච්චායන ව්‍යාකරණයට පසුව රචනා කොට තිබේ. ඊට හේතුව කච්චායන ව්‍යාකරණයේ යම් යම් ස්ථාන විවේචනයට ලක්කරමින් මොග්ගල්ලායන මතය දැක්වීම යි. පළමුව සූත්‍ර හා උදාහරණ දක්වමින් පසුව වෘත්ති රචනා කොට තිබේ.

*"ථෙරේන යං සද්දසත්ථං රචිතා තස්ස වුත්ති,*
*පුන තෙනේව රචිතා මොග්ගල්ලානෙන"*

මොග්ගල්ලායන ව්‍යාකරණය සතුව සූත්‍ර 816 දක්නට ලැබේ. එකී සූත්‍ර එක්කරමින් ග්‍රන්ථය පරිච්ඡේද හයකට සංග්‍රහ කර තිබේ. පරිච්ඡේද කාණ්ඩ වශයෙන් නම් කරයි.

01. සංඥා කාණ්ඩය
02. ස්‍යාදි කාණ්ඩය
03. සමාස කාණ්ඩය
04. ණාදි කාණ්ඩය
05. ඛ්‍යාදි කාණ්ඩය
06. ත්‍යාදි කාණ්ඩය

තත් ව්‍යාකරණයේ ප්‍රථම සංඥා කාණ්ඩයේ දී සන්ධි කාර්යය සඳහා සූත්‍ර 58 යොදා ගනී. ස්‍යාදි කාණ්ඩය කාරක හා නාම වරනැඟීම සඳහා සූත්‍ර 243 ද ස්ත්‍රී ප්‍රත්‍ය හා සමාස දක්වන සමාස කාණ්ඩය සඳහා සූත්‍ර 116 ද තද්ධිත දක්වන ණාදි කාණ්ඩය සඳහා 142 ද කිතක දක්වන ඛ්‍යාදි කාණ්ඩය සඳහා 179 ද අවසාන ත්‍යාදි කාණ්ඩයයේ දී ව්‍යාකරණ විධික්‍රම හා ආඛ්‍යාත වරනැඟීම සඳහා සූත්‍ර 78 ද භාවිත කොට තිබේ. මොග්ගල්ලායන ව්‍යාකරණ සම්ප්‍රදාය සතුව පශ්චාත් කාලීනව රචිත ව්‍යාකරණ ග්‍රන්ථ රාශියක් දක්නට ලැබේ. ඒ අතර මොග්ගල්ලායන පඤ්චිකාව, මොග්ගල්ලායන විරිත සන්නය, පද සාධනය, පද සාධන සන්නය, බුද්ධිපසාදිනී පදසාධන ටීකාව, පයෝගසිද්ධිය, සම්බන්ධචින්තා, සම්බන්ධචින්තා ටීකා, සම්බන්ධචින්තා පුරාණ සන්නය හා පඤ්චිකා ප්‍රදීපය ප්‍රධාන වෙයි.

## සද්දනීති ව්‍යාකරණය

පාලි ව්‍යාකරණ ග්‍රන්ථ අතර විශාලත ම ව්‍යාකරණය සද්දනීතිය යි. එසේ ම තෙවැනි ව්‍යාකරණ සම්ප්‍රදාය ද මෙයයි. සද්දනීතිය ලක්දිව රචනා කළ කෘතියක් නොවෙයි. එය බොහෝ උගතුන්ගේ උත්තානීකරණයෙන් සක්සුදක් සේ සුපැහැදිලි ය. මෙය රචිත දේශය බුරුමය යි. ලක්දිවට ආගන්තුක ව්‍යාකරණ සම්ප්‍රදායකි. බුරුමයේ අරිමද්දන නුවර අග්ගමහා පණ්ඩිත අග්ගවංස හිමි මෙහි කර්තෘවරයාණෝ වෙති. රචිත වර්ෂ ලෙස 1154 බොහෝදෙනා පිළිගනී

> *"During the reigns of Anorata's immediate successors learning took firm root at pagan, an in the year 1154 the monk Aggavamsa completed the saddaniti"*[27]

M.H Bode ප්‍රකාශ කරන්නේ පගාන් නුවර අනවරථ රජුගේ කාලයේ සද්දනීතිය රචනා වූ බවයි. W.Geiger ද මෙහි කර්තෘත්වය පිළිබඳ සටහන් කරයි. කර්තෘත්වය බුරුමයේ අර්මද්දන නුවර අග්ගවංස හිමියන් බවත්; මෙම සද්දනීතිප්පකරණය උත්තරජීව හිමියන් ලක්දිවට රැගෙන ආ බවත්; රචිත වර්ෂය වශයෙන් ඔහු පෙන්වාදෙන්නේ 1154 වර්ෂය යි.[28] පොල්වත්වත්තේ බුද්ධදත්ත

හිමියන්ගේ අදහස වන්නේ මහාපරක්‍රමබාහු යුගයේ දී සද්දනීතිය ලක්දිවට ගෙන නො ආ බවයි.[29] සුභූති හිමියන් හා ගුණපාල මලලසේකර වැනි උගතුන් ඒකමතිකත්වයෙන් සද්දනීති කර්තෘත්වය අග්ගවංස හිමියන් බව පිළිගනී.[30] තත් ග්‍රන්ථ කර්තෘනාමසන්දර්ශනයේ දී අග්ගවංස හිමියෝ සමන්තභද්ද නම් අග්ගමහාපණ්ඩිත මහතෙරුන් වෙත උපාධ්‍යායග්‍රහණය කළ ඒ අග්ගමහාපණ්ඩිතයන්ගේ ම ශිෂ්‍ය වූ සමන්තභද්ද වූ දෙවැනි අග්ගපණ්ඩිත තෙරුන්ගේ සොහොයුරිකගේ පුත්‍ර වූ ඒ අග්ගපණ්ඩිත නාමය ලැබූ සුසම්ප්‍රදා ඇති කරණසම්පත්තීන් හටගත් නිවැරදි වචන ඇති අරිමද්දන නුවරවාසී වූ අග්ගවංස හිමියන් විසින් කරන ලද සද්දනීති ප්‍රකරණය නිමි බව ප්‍රකාශ කරති.[31] අග්ගවංස හිමියන් විසින් සුරචිත සද්දනීතිප්පකරණය උත්තරජීව තෙරුන් විසින් පොළොන්නරු යුගයේ දී ලක්දිවට ගෙනැවිත් තිබේ. මෙය පරිච්ඡේද 28 ක් තුළ ගාථා 770 ද සූත්‍ර 1347 අන්තර්ගත වෙයි. බණවර 70 පමණ වෙයි. මෙහි දී "පරිච්ඡේද" එම නාමයෙන් ම නම් කොට තිබේ. අනෙක් සියලු ව්‍යාකරණයන් අභිබවා මෙය විශාල වෙයි. ග්‍රන්ථය පිළිබඳ සඳහන් ස්ථානයන්හි දී චූලසද්දනීතිය හා මහාසද්දනීතිය වශයෙන් ව්‍යවහාර කරනමුත් කර්තෘ එසේ විභේදනයට ලක්නොකරයි. චූලසද්දනීතිය යනුවෙන් ව්‍යවහාර කරන කොටසට පරිච්ඡේද දහ නවයක් අයත් වෙයි. ඒ අනුව,

01. සවිකරණාඛ්‍යාත විභාග පරිච්ඡේදය
02. ක්‍රියාපද මාලා විභාග පරිච්ඡේදය
03. පකිණ්ණක විනිච්ඡය පරිච්ඡේදය
04. නාමක රූපවිභාග පරිච්ඡේදය
05. නාමික පදමාලා විභාග පරිච්ඡේදය
06. අකාරාන්ත පුල්ලිංග පකතිරූප නාමක පදමාලා විභාග පරිච්ඡේදය
07. නිග්ගහීතාදි පුල්ලිංග පකතිරූප පදමාලා විභාග පරිච්ඡේදය
08. නපුංසකලිංග පකතිරූප නාමික පදමාලා විභාග පරිච්ඡේදය
09. සවිනිච්ඡයෝ උකාරාන්ත නපුංසකලිංග පකතිරූප නාමික පදමාලා පරිච්ඡේද

10. ලිංගත්ථයමිස්සක නාමික පදමාලා විභාග පරිච්ඡේදය
11. වාච්චාභිධෙය්‍යලිංගාදි පරිදීපනො නාමික පදමාලා පරිච්ඡේදය
12. සබ්බනාම තංසදිසනාමානං නාමික පදමාලා විභාග නාම පරිච්ඡේදය
13. සවිනිච්ඡයො සංඛ්‍යානාම නාමික පදමාලා නාම පරිච්ඡේදය
14. අත්ථන්තික විභාග නාම පරිච්ඡේදය
15. සරවග්ගපඤ්චතිකො නාම ධාතුවිභාග පරිච්ඡේදය
16. භුවාදී ගණ පරිච්ඡේදය
17. රුධාදිජක්කං නාම පරිච්ඡේදය
18. චුරාදිගණපරිදීපන පරිච්ඡේදය
19. සබ්බගණවිනිච්ඡය නාම පරිච්ඡේදය

මෙම පරිච්ඡේද 19 ම වැය කොට තිබෙන්නේ නාමපද හා ක්‍රියාපද විස්තර විභාග කිරීම සඳහා ය. අලුත් නාමපද ඉදිරිපත් කරමින් ඒවා වරනැඟෙන ආකාරය දක්වයි. ධාතු හා ගණ දක්වමින් ආඛ්‍යාත වරනැඟීම දක්වනු ලබයි. ඉතිරි පරිච්ඡේද නවය මහාසද්දනීතිය වශයෙන් ව්‍යවහාර කරයි. ඊට හේතුව වශයෙන් පෙනී යන්නේ සද්දනීතිප්පකරණය ආරම්භ කරනුයේ *"නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස"* යනුවෙන් බුද්ධාභිවන්දනය කරමින් ය. මෙම මහාසද්දනීතිය නම් කොටසත් ආරම්භ කරනුයේ නැවතත් බුද්ධාභිවන්දනයෙන් ය. එම නිසා තත් ග්‍රන්ථය දෙකොටසකින් යුත්ත බව සැලකුවා විය හැකි ය. ග්‍රන්ථයේ එසේ වර්ග කිරීමක් දක්නට නොලැබේ. අවසන් පරිච්ඡේද නමය නම්,

20. සන්ධිකප්පනාම පරිච්ඡේදය
21. කාරකවිභාග නාම පරිච්ඡේදය
22. පරිච්ඡේදය නම් කර නැත
23. සමාස කප්ප නාම පරිච්ඡේදය

24. තද්ධිත කප්ප නාම පරිච්ඡේදය
25. ආඛ්‍යාත කප්ප නාම පරිච්ඡේදය
26. කිබ්බිධා කප්ප නාම පරිච්ඡේදය
27. වාචොගධපද විභත්ති නාම පරිච්ඡේදය
28. පාලිනයාදි සංගහො පරිච්ඡේදය

සද්දනීත්ප්පකරණයේ විසිවැනි පරිච්ඡේදයේ සිට ව්‍යාකරණයට අදාළ සූත්‍රවලින් සන්ධි, සමාස, තද්ධිත, ආඛ්‍යාත හා කෘදන්ත දක්වනු ලබයි. සද්දනීත්ප්පකරණය ප්‍රධාන වශයෙන් කොටස් තුනක් ඔස්සේ සියලු පරිච්ඡේද සංග්‍රහ කොට තිබේ.

01. පදමාලා
02. ධාතුමලා
03. සුත්තමාලා

පදමලා කොටසෙහි නාම පදවල හා ක්‍රියාපදවල සියලු විස්තරකථන දක්වන අතර ධාතුමාලා කොටසෙහි ධාත්වාර්ථ හා ආඛ්‍යාත වරනැඟීම විස්තර කරයි. සුත්තමාලා කොටසෙහි දී "අප්පභුතෙකතාළීවණ්ණාසද්දා"[32]

සන්ධි ආදී ව්‍යාකරණ කාර්යය විහිත සූත්‍ර දක්නට ලැබේ. එහි දී මූලික වශයෙන් ව්‍යාකරණ ඉදිරිපත් කරයි. සද්දනීති ව්‍යාකරණයේ ග්‍රන්ථ සැලැසුම පවා අනන්‍ය ව්‍යාකරණයන්ට වඩා වෙනස් ය. ඊට හේතුව සද්දනීතිය රචනා කිරීම සඳහා උපයුක්ත කොටගත් මූලාශ්‍රය මාර්ගයන්ගේ ස්වභාවය වශයෙන් හැඳින්වීමට පුළුවනි. එසේ ම රචිත දේශයේ ද යම් පමණ බලපෑමක් තිබෙන්නට ඇති බව සිතීමට පුළුවනි. ලක්දිව රචිත අනෙක් ව්‍යාකරණ සියල්ල ම පාහේ සංස්කෘත ව්‍යාකරණ ගුරුකොට ගෙන තිබේ. ඉන්දු ආර්ය භාෂා ලක්දිවට බොහෝ සෙයින් යම් යම් අවස්ථාවන්හි දී බලපා ඇති බව පෙනේ. එසේ බලන විට භාෂාවේ බලපෑම නිසා ද සද්දනීතිය ස්වාධීන ලක්ෂණ ප්‍රකට කිරීමට හේතුවන බව සිතීමට පුළුවන. ලක්දිවට අනන්‍ය වූ ව්‍යාකරණයක් තිබී පශ්චාත්කාලීනව සංස්කෘත ව්‍යාකරණ ආභාස කොට පාලි ව්‍යාකරණ බිහි වී තිබේ.

## ආන්තික සටහන්

**මෙහි භාවිත ත්‍රිපිටක ග්‍රන්ථ බුද්ධ ජයන්ති පුනර් මුද්‍රණ වන අතර විශේෂයෙන් සඳහන් කරන ස්ථානයක හැර තදීයට්ඨකථා හේවාවිතාරණ මුද්‍රණ වේ.**


1. මජ්ඣිමනිකාය, 510 පිටුව
2. අංගුත්තරනිකාය අට්ඨකථා i, 409 පිටුව, සද්දනීති ව්‍යාකරණ, 799 පිටුව, අරුග්ගොඩ සීලරතන හිමි (සංස්:) 1909.
3. දීඝනිනා ටීකා, 170 පිටුව, කංඛාවිතරණී ටීකා, 49 පිටුව, යූ.පී ඒකනායක (සංශෝධන) 1923
4. සද්දසාරත්ථජාලිනී, 101 පිටුව, සීලානන්ද, විජයනගර් මුද්‍රණ
5. විසුද්ධිමග්ග, 155 පිටුව, 1919. ඛුද්දකපාඨ අට්ඨකථා, 69 පිටුව, 1922. මහානිද්දේසපාළි, 187 පිටුව, විනය අට්ඨකථා, 75 පිටුව, සටී, 49 පිටුව, සද්දනීති, 772, 773 පිටු, The Path of Purification, 224,225p, Bikku Nanamoli,Colombo,1956
6. මහානිද්දේසපාළි අට්ඨකථා i, 09 පිටුව, විසුද්ධිමග්ග, 384 පිටුව, විභංග අට්ඨකථා, 64 පිටුව, අංගුත්තරනිකාය අට්ඨකථා i, 08 පිටුව, ඛුද්දකපාඨ අට්ඨකථා, 69 පිටුව, 1923. උදානපාළි අට්ඨකථා, 16 පිටුව, 1920. පටිසම්භිදාමග්ග අට්ඨකථා, 367 පිටුව, 1927. දීඝනිකාය අට්ඨකථා i, 26 පිටුව, 1918. සංයුත්තනිකාය අට්ඨකථා, 08 පිටුව, 1924. විනය අට්ඨකථා, 342 පිටුව, රූපසිද්ධි, 154 පිටුව, වෑගම පියරතන හිමි (සංස්:) 1997. පයෝගසිද්ධි, 115 පිටුව,

   The Sumangala Vilasini, 33 p, T.W.Rhys Davids and J.Esting Carpenter (Edit) Pali Text Society, London, 1968
7. සද්දනීති, iv පිටුව,' පටිසම්භිදාමග්ග, 06 පිටුව, පදසාදන ටීකාව, i පිටුව (විඤ්ඤත්ති) ඒ. ඩී. ඒ. විජේයාසිංහ 1908, බාලාවතාර ටීකාව, ii පිටුව, (විඤ්ඤාපන) එච්. සුමංගල හිමි (දෙවැනි සංස්කරණ) 1913
8. විසුද්ධිමග්ග, 155 පිටුව
9. අපදානපාළි අට්ඨකථා ii, 417 පිටුව
10. මජ්ඣිමනිකාය අට්ඨකථා, 89 පිටුව
11. එම,
12. එම,
13. අපදානපාළි අට්ඨකථා ii, 417 පිටුව,
14. මහාරූපසිද්ධි ටීකා, 314, 315 පිටු, කලුකොදයාවේ පඤ්ඤාසේකර හිමි, 1964.

15. කච්චායන සුත්ත නිද්දේස, 03 පිටුව, ඒකෝ බුද්ධිපබ්බජිතෝ භගවතෝ සන්තිකේ කම්මට්ඨානං ගහෙත්වා අනෝතත්තතීරේ සාලරුක්ඛමූලේ නිසින්නෝ උදයබ්බයකම්මට්ඨානං කරෝති; සෝ උදකේ චරන්තං බකං දිස්වා උදක බකන්ති කම්මට්ඨානං කරෝති; භගවා තං විතතභාවං දිස්වා බුද්ධිපබ්බජිතං පත්කෝසාපෙත්වා අත්ථෝ අක්ඛරසඤ්ඤාතෝ ති වාක්‍යමාහ; කච්චායනථෙරෝ'පි භගවතෝ අධිප්පයං ජානිත්වා අත්ථෝ අක්ඛරසඤ්ඤාතෝ'ති වාක්‍යං පුබ්බේ ඨපෙත්වා ඉදං පකරණං කතන්ති; කච්චායනේන කතසුත්තම්පි වදන්ති.

16. කච්චායන වණ්ණනා, 08 පිටුව. 1905. අත්ථෝ අක්ඛරසඤ්ඤාතෝ'ති ආදිමහ. ඉදං සුත්තං කෙන වුත්තං; භගවතා වුත්තං; කදා වුත්තන්තීති? යම උප්පලනාමකා ද්වේ බ්‍රාහ්මණා බයවය කම්මට්ඨානං ගහෙත්වා ගච්ඡන්තා නදී තීරේ බයවයං බයවයන්ති කම්මට්ඨානේ කායිරමානේ ඒකෝ උදකේ මච්ඡං ගණ්හිතුං චරන්තං බකං දිස්වා උදක බකෝ'ති විප්ජති. ඒකෝ සටෙ පටං දිස්වා සටපටෝ'ති විප්ජති; තදා භගවා ඔභාසං මුඤ්චිත්වා අත්ථෝ අක්ඛරසඤ්ඤාතෝ'ති වාක්‍යං ඨපේති. තේසං ච කම්මට්ඨානං පතිට්ඨති. තස්මා භගවතා වුත්තන්ති; වුච්චති. තං ඤත්වා මහාකච්චායනෝ භගවන්තං යාචිත්වා හිමවන්තං ගහෙත්වා මනෝසිලාතලේ දක්ඛිණදිසාභාගං සීසං කත්වා පුරත්ථිම දිසාමුඛෝ හුත්වා අත්ථෝ අක්ඛරසඤ්ඤාතෝ'ත්‍යාදිකං කච්චායනපකරණං විරචි. ථෙරේන ඨපිතත්තා වුත්තං.

17. එම, iii පිටුව

18. ශ්‍රී ලංකාවේ පාලි ව්‍යාකරණ පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්, 76 පිටුව, කහටපිටියේ රාහුල හිමි, 1993 හොරණ. ලංකා පාලි සාහිත්‍යය, 135 පිටුව, ගුණපාල මලලසේකර, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1965 කොළඹ.

19. රූපසිද්ධි, 154 පිටුව

20. නාමමාලා, xxx පිටුව, වස්කඩුවේ සුභූති හිමි,

21. මොග්ගල්ලායන ව්‍යාකරණ, නිගම ගාථා, දේවමිත්ත හිමි (සංස්:) 1919.

22. ඌණ පූරණ සහිත මහාවංසය, 505 පිටුව 37 පරි: 9 ගාථාව, පොල්වත්තේ බුද්ධදත්ත හිමි 1959.

23. මොග්ගල්ලාන පඤ්චිකා, 3 පිටුව, තොටගමුවේ රාහුල හිමි 1896.

24. පදසාධන ටීකා, 07 පිටුව, මොග්ගල්ලානො ච ආචරියො ච මොග්ගල්ලානාචරියෝ'ති ඉමිනා සුතසීලාදී ගුණේහි ලෝක සම්මත මාගධස්ස සද්දලක්ඛණස්ස කත්තාරං මහාසාමිඨානාන්තරප්පත්තමත්තනෝ ආචරියං දස්සෙති; සොයෙව සද්දත්ථකරණෙ අත්තනෝ උත්තරීභාවේන වරෝ පවරෝ තංච තනු ච යං තං සද්දානං නිච්චෝ සම්බන්ධෝ කථං මොග්ගල්ලායනාචරියවරඤ්චාපි එත්ථ තං සද්දභාවෝ.

25. Pali Literature and Language, 53p. Willhem Geiger, Calcutta, 1943. Therewith is surely meant parakkamabhahu I (1153-1186 A.D). Moggallana was an inhabitant of Anuradhapura, Where he Was member of the Thuparama

26. මොග්ගල්ලායන ව්‍යාකරණ, 1 පිටුව

27. The Pali Literature of Bruma,16p, M.H Bode ගේ අදහස ම Journal of the Pali Text Society (vole:xvii, 1992) 2p, Exploring the saddniti ලිපියෙන් E.G Kahars දක්වයි.

28. Pali Literature Language, 54,55p

29. පාලි සාහිත්‍ය, 471 පිටුව, පොල්වත්තේ බුද්ධදත්ත හිමි, 2002.

30. නාමමාලා, xix, ලංකා පාලි සාහිත්‍ය, 136 පිටුව, ගුණපාල මලලසේකර 1965.

31. සද්දනීති, 814 පිටුව. ඉති සමන්තභද්දස්ස මහාඅග්ගපණ්ඩිතස්ස සන්තිකේ ගහිතූපජ්ඣෙන; තංසිස්ස සමන්තභද්දස්ස අග්ගපණ්ඩිතස්ස භාගිනෙය්‍යෙන පටිලද්ධතන්නාමධෙය්‍යෙන සුසම්පදායෙන කරණසම්පත්තිජනිතනිර-වජ්ජවචනේන අරිමද්දනපුරවාසීනා අග්ගවංසාරියේන කතං සද්දනීතිප්පකරණං නිට්ඨිතං

32. එම,